# මැක්සික්‍රොප් යෙදීමේ නිර්දේශය

## ක්‍රීඩා පිට්ටනි, තණ මඩුලු

- මැක්සික්‍රොප් දියර අවු.1ක් වතුර ගැලුම් 3ක් සමග මිශ්‍ර කර (මිලි. 25ක් වතුර ලීටර් 12ක පමණ) බලවේග හෝ නැප්සැක් ඉසින යන්ත්‍රයක් මගින් නැතිනම් මල් බාල්දියකින් යොදන්න. යටත් පිරිසෙයින් අවුරුද්දකට දෙවරක් තණ කැපීමෙන් පසු මුලු ප්‍රදේශයම තෙත් කරන්න. පස නිසරු හෝ තණ කොළ හොඳින් නොවැවී ඇති ස්ථානයන්ට අපේක්ෂිත පරිදි තණ කොළ වැවෙන තෙක් මසකට වරක් මැක්සික්‍රොප් යොදන්න.

## ඕකිඩ්

- මැක්සික්‍රොප් දියර අවු.1ක් වතුර ගැලුම් 3ක් සමග මිශ්‍ර කර (මිලි. 25ක් වතුර ලීටර් 12ක පමණ) දින 4 - 5 කට වරක් ස්ප්‍රේ කරන්න. ස්ප්‍රේ යන්ත්‍රයක් නොමැතිනම් මල් බාල්දියකින් යොදන්න.

## රෝස, ඇන්තූරියම්, බෝගන්විලා, මල් වර්ග සහ පත්‍ර ඇතුළු පෝච්චි පැළ

- මැක්සික්‍රොප් දියර අවු.1ක් වතුර ගැලුම් 3ක් සමග මිශ්‍ර කර (මිලි. 25ක් වතුර ලීටර් 12ක පමණ) දින 7 - 10 කට වරක් ස්ප්‍රේ කරන්න. නැතිනම් මල් බාල්දියකින් යොදන්න.

## තවාන් පැළ

- මෑදු හෝ සිටුවීමට ගන්නා සියලු කැබලි සිටුවීමට පෙර පැය 24ක් පමණ මැක්සික්‍රොප් 1:300 දියරය මිශ්‍රනයක (එනම් දියර අවු.1ක් වතුර ගැලුම් 2ක මිශ්‍රකර) පෙගෙන්නට හැරීමෙන් වඩාත් හොඳ ප්‍රතිඵල ලබාගත හැකිය. මුල් අල්ලන මාධ්‍යද මැක්සික්‍රොප් 1:400 මිශ්‍රනයෙන් (දියර අවු. 1ක් වතුර ගැලුම් 1 1/2) සිටුවන අවස්ථාවේදීත් ඊට සතියකට පසුවත් හොඳින් තෙත් කරන්න.
- සිටුවීමට සඳහා වඩාත් හොඳ කැබලි ලබා ගැනිම සඳහා මැක්සික්‍රොප් අවු. 4ක් වතුර ගැලුම් 2 1/2ක දියකොට, කැබලි ලබා ගැනීමට සති 4ක පමණ පෙර සිට සතියකට වරක් කැබලි ලබාගන්නා මව් ශාකයට හොඳින් ඉසින්න. මුල් ඇද්දු කැබලි සිටුවන විට දියර අවු. 4ක් වතුර ගැලුම් 1 1/2ක දියකොට මෙම මිශ්‍රනය සතියකට සතියකට වරක් ඉසින්න.
- ඇල්ලීමට තරම් විශාල බීජ වැපිරීමට පෙර මැක්සික්‍රොප් 1:400 දියරයක (අවු. 1ක් වතුර ගැලුම් 2 1/2ක) පැය 24ක් පෙගෙන්නට තබන්න. එම මිශ්‍රනයේම ද්‍රාවනයක් සතියකට වරක් බැගින් බීජ පාත්තියට මනා ලෙස වත් කරන්න.

## කොළ පොහොර

- දිරාපත්වීම ඉක්මන් කරවීමට හා මෙම කාර්යය සඳහා සත්ව පොහොර අවශ්‍ය වීම වෙනුවට මැක්සික්‍රොප් දියර අවු. 2ක් වතුර ගැලුම් 2 1/2ක දියකොට මසකට වරක් බැගින් කොළ පොහොර ගොඩවලට වත් කරන්න.
- **මැක්සික්‍රොප්** වලින් සෙත සලසන අනෙකුත් බෝග වර්ගයන් බොහෝය.




LANKEM
ලංකෙම් லங்கெம்

ගොවියාගේ හිත මිතුරා

212 A 3/1. නාවල පාර, රාජගිරිය. දුර ක: 011 776 6000

සරු අස්වැන්නක රහස

# මැක්සික්‍රොප්

## කාබනික දියර පොහොර

අපිත් හොඳට දන්නවා...

මමත් හොඳට දන්නවා...




- N,P,K ඇතුළු ඛණිජ වර්ග 60 කට වඩා අධික දියර පොහොරකි.
- පත්‍රවල ප්‍රභාසංස්ලේෂණය වැඩිකර, ශාක වර්ධනය සීඝ්‍ර කරයි.
- ස්වාභාවික මුහුදු පැළෑටි නිස්සාරකයකි.

LANKEM
ලංකෙම් லங்கெம்
ගොවියාගේ හිත මිතුරා

**Maxicrop®**

දැන් වෙළඳ පොළේ

# මැක්සික්‍රොප් යනු

මුහුදු පැලෑටි නිස්සාරකයක් නිසා පැලෑටිවල පත්‍ර සහ මුල් තුලින් වේගයෙන් උරා ගන්නා අතර පස සකසනයක් ද වේ. එය 100% ක් කාබනික සංයොගයක් වන බැවින් **විෂ රහිත වන අතර පැලෑටින්ට, මිනිසුන්ට හෝ සත්වයින්ට කිසිඳු හානියක් සිදු නොවේ.**

## මැක්සික්‍රොප් වල අඩංගු දෑ

### පෝෂ්‍ය පදාර්ථ

පැලෑටියක සමබර වැඩීමට අවශ්‍ය කරන ප්‍රධාන මූල ද්‍රව්‍ය සහ අංශු මාත්‍ර මූල ද්‍රව්‍යන් 60 කට අධික ප්‍රමාණයක් ශාකයට පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැකි තත්වයෙන් මැක්සික්‍රොප්හි අඩංගුව පවතී.

- ප්‍රධාන මූලද්‍රව්‍යයන් වන **N, P, K.**
- පරිවෘත්තීය ක්‍රියාකාරකම්වලට අවශ්‍ය **Mn, Ca, S, Fe, B, Mg, 2n, Mo.**

### වර්ධක හෝමෝන

පැළෑටියක වර්ධන ක්‍රියාවලිය හා සම්බන්ධ වන ඔක්සීන හා ප්‍රධාන ශාක හෝමෝන වන ගිබරලින් හා සයිටොකයිනින්ද මැක්සික්‍රොප්හි අඩංගු වේ.

## මැක්සික්‍රොප් සතු විශේෂ ලක්ෂණ

- මැක්සික්‍රොප් ඉහල ගුණාත්මයක් හා වැඩි අස්වැන්නක් සහතික කරයි.
- මැක්සික්‍රොප් ශාකයේ පැවතීගෙන ආ නිරෝගී වැඩීම ප්‍රබල කරවයි.
- මැක්සික්‍රොප් මගින් කෘමින්ට සහ රෝගයනට ඔරොත්තු දෙන නිරොගී පැළ සහ දීප්තිමත් මල් නිසැකවම ලබාදෙයි.
- මැක්සික්‍රොප් ශක්තිමත් සහ හොඳින් පැතිරුණු මූල පද්ධතියක් ඇතිකරවයි.
- මැක්සික්‍රොප් පසෙහි වයනය සහ ජලය රඳ ගැනිමේ ගුණාංගය වැඩි කරවන අතර පසෙහි හිතකර ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය නංවාලයි.

## මැක්සික්‍රොප් යොදන අයුරු

- මැක්සික්‍රොප් ඉසින යන්ත්‍රයක් මගින් හෝ මල් බාල්දියකින් යෙදිය හැක.
- එය ශාකයේ ඕනෑම වර්ධන අවස්ථාවක යෙදිය හැක.
- නියමිත පරිමාවක් අනුව ජලය සමඟ මිශ්‍ර කිරීමෙන් මැක්සික්‍රොප් යෙදීම වඩාත් පහසු කරයි.
- මැක්සික්‍රොප් ජලය සමඟ මිශ්‍ර කිරීමට පළමුව බෝතලය හොඳින් සොලවා ගත යුතුයි.
- යෙදීමට ප්‍රථම සාදගත් මිශ්‍රණයද හොඳින් කලතා ගත යුතුයි.




# මැක්සික්‍රොප් යෙදීමේ නිර්දේශය

### තේ තවාන්

- පැළ සිටවූ දිනෙන් ආරම්භ කර දින 7 – 10 කට වරක් බැගින් සති 4 – 6 දක්වා කාලයක් ඉසින්න. මැක්සික්‍රොප් දියර අවුන්ස එකක් වතුර ගැලුම් 2 1/2ක (මිලි ලීටර් 25ක් වතුර ලීටර් 10ක පමණ) මිශ්‍රකොට නැප්සැක් ස්ප්‍රේ යන්ත්‍රයක් මගින් පත්‍ර සහ පසද හොඳින් තෙමී යන සේ ඉසින්න. මේ අයුරින් මුලින් කරන ලද ඉසීම් 4 – 6 ට පසුව නැවත ක්ෂෙත්‍රයෙහි සිටුවනතෙක් මාසයකට වරක් බැගින් මැක්සික්‍රොප් යොදන්න. (තවාන් පැළ යන කොටසද බලන්න)

### නැවත සිටවූ තේ ඉඩම්

- මසකට වරක් බැගින් හය මාසයක් යන තෙක් අක්කරයට මැක්සික්‍රොප් ගැලුමක් සුදුසු වතුර ප්‍රමාණයක මිශ්‍රකොට බලවේග ඉසින යන්ත්‍රයකින් ඉසින්න. ඉන්පසු දළු නෙලන අවස්ථාව තෙක් මාස 2 කට වරක් බැගින් ( ලීටර් 4.5 ) ඉසින්න.

### දළු කඩන තේ

- කප්පාදු කිරිමෙන් පසු පළමුවන අවුරුද්දේ දී ප්‍රබල නිරෝගී වැඩිම සඳහා හෝ තද මිදුණු පින්නෙන් සිදුවන හානි වලට ඔරොත්තු දීම වැඩි කිරිම සඳහා හෝ මාස 2කට වරක් බැගින් අක්කරයකට මැක්සික්‍රොප් ගැලූමක් ඉසින්න.

### පළතුරු ගස්

- මාස 02කට වරක් බැගින් අක්කරයකට මැක්සික්‍රොප් ගැලූමක් සුදුසු වතුර ප්‍රමාණයක මිශ්‍රකොට ඉසින්න. එක් එක් පළතුරු ගසට ඉසීම සඳහා මැක්සික්‍රොප් දියර අවු. 1ක් වතුර ගැලුම් 3ක මිශ්‍රකොට, පත්‍රයන් මැනවින් තෙමී යන සේ ඉසින්න.

### අර්තාපල්, කැරට්, බිට්, ඌණු සහ අනෙකුත් අල බෝග

- මැක්සික්‍රොප් දියර අවු. 2ක් වතුර ගැලුම් 3ක් සමග මිශ්‍ර කර, (මිලි. 50ක් වතුර ලීටර් 12ක් පමණ) දින 10 - 14 කට වරක් මැනවින් ඉසින්න.

### ගෝවා, සලාද, සැල්දිරි සහ අනෙකුත් කොළ එළවලු

- මැක්සික්‍රොප් දියර අවු. 2ක් වතුර ගැලුම් 3ක් (මිලි. 50ක් වතුර ලීටර් 12ක් පමණ) සමග මිශ්‍ර කර, බෝගයන් මැනවින් තෙමී යන සේ ඉසින්න.

### ගොයම්

- මැක්සික්‍රොප් දියර අවු. 1ක් වතුර ගැලුම් 3ක් (මිලි. 25ක් වතුර ලීටර් 12ක් පමණ) සමග මිශ්‍ර කර දෙවරක් ඉසින්න.
- **පළමු යෙදීම,** වී වපුරා හෝ පැළ සිටුවා දින 10 -14 කට පසුව.
- **දෙවැනි යෙදීම,** ගොයම් පීදිමට සතියකට කලින්.